2012 වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව

පටුන

		පිටුව
1.	දැක්ම හා මෙහෙවර ප්‍රකාශය	03
2.	කාර්යයන්	04
3.	රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියෙහි ක්‍රියාකාරිත්වය - 2012	05
4.	2012 වර්ෂයේ කාර්යසාධනය	14
5.	පාලන හා ගිණුම්	22

දැක්ම

තිරසාර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක්
ස්ථාපිතවීම සහතික කිරීම

මෙහෙවර

රජයේ පුළුල් සංවර්ධන ක්‍රියා රාමුව තුළ
රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය
සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම

කාර්යයන්

- පෞද්ගලික, රාජ්‍ය සහ ජාත්‍යන්තර නියෝජිතයන් සම්බන්ධීකරණය කරමින් මැදිකාලීන අයවැය රාමුවක් තුළ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම,

- බදු ප්‍රතිපත්ති සහ ඊට අදාළ අනෙකුත් අණ පනත් සකස් කිරීම, (තීරු බදු සහ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද හැර)

- රාජ්‍ය ආදායම් සහ ලැබීම් ඇතුළත්ව රාජ්‍ය මූල්‍ය පෙළගැස්ම සහ රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වය කළමනාකරණය සහ නිරීක්ෂණය,

- සියලුම වාර්තාකරණයන් ඇතුළත්ව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත ක්‍රියාත්මක කිරීම

1. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියෙහි ක්‍රියාකාරිත්වය - 2012

2011 වර්ෂයේ දී ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස සියයට 6.9 ක් වූ අයවැය හිඟය 2012 වර්ෂයේ දී සියයට 6.4 මට්ටමක පවත්වා ගනිමින්, මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ක්‍රියා රාමුව තුළ අයවැය හිඟය අඩු මට්ටමක පවත්වා ගැනීම සඳහා වන කැපවීම තවදුරටත් ශක්තිමත් කර ඇත. කෙසේ වුවද, 2012 අයවැය මඟින් ප්‍රකාශිත සියයට 6.2 ක් වූ අපේක්ෂිත අයවැය හිඟය ආන්තික වශයෙන් ඉක්මවා ඇත. අයවැය හිඟය ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස 2009 වර්ෂයේ දී සියයට 9.9 සිට 2010 වර්ෂයේ දී සියයට 8.0 දක්වා අඩු කර ඇත. 2010 සහ 2011 වර්ෂවලදී වැඩි වෙමින් පැවති වෙළෙඳ ශේෂයේ හිඟය පාලනය කිරීම සඳහා 2012 වර්ෂයේ මුල්භාගය තුළ දී හඳුන්වා දුන් බදු වැඩි කිරීම්, ණය වර්ධනය සීමා කිරීම සහ විනිමය අනුපාතිකය වඩා නම්‍යශීලී ලෙස තීරණය වීමට ඉඩ හැරීම හේතුවෙන් ඇති වූ සංකෝචනාත්මක බලපෑම පිළිබිඹු කරමින් බදු ගෙවීමට යටත් වන ආනයන කැපී පෙනෙන ලෙස අඩු වීම සහ දේශීය ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමීවීමෙහි ප්‍රතිඵලයක් ලෙස ද.දේ.නි. වර්ධනයට සාපේක්ෂව අඩු මට්ටමක පැවැති රාජ්‍ය ආදායමට අනුකූලව රාජ්‍ය වියදම තාර්කීකරණය කිරීම තුළින්, 2012 වර්ෂයේ දී අඛණ්ඩව තෙවැනි වසරටත් අයවැය හිඟය ක්‍රමිකව අඩු වන ප්‍රවනතාවයක් පවත්වා ගැනීමට හැකි විය.

අයවැය හිඟය අපේක්ෂිත මට්ටමට ආසන්නව පවත්වා ගැනීමට රජයට හැකි වුවද, 2012 වර්ෂයේ සමස්ත රාජ්‍ය මූල්‍ය කළමනාකරණය කිරීමේ දී අභියෝග කිහිපයකට මුහුණ දීමට සිදු විය. 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේ දී මෝටර් රථ වාහන ආනයන ප්‍රමාණය 533,056 සිට 374,175 දක්වා අඩු වීම හා ආනයන වටිනාකම ඇ.ඩො. මිලියන 881 සිට මිලියන 495 දක්වා අඩු වීම සහ ඒ හා සම්බන්ධ දේශීය වෙළඳාම් කටයුතු හා විශේෂයෙන්ම මූල්‍ය කල්බදු පහසුකම් සැපයීම වැනි සේවා කටයුතු අඩු වීම 2012 වර්ෂයේ ආනයන බදු ආදායමෙහි වර්ධනය කෙරෙහි අහිතකර ලෙස බලපෑවේය. මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම හේතුවෙන් පුද්ගලික අංශයට ලබා දුන් ණය ප්‍රමාණය ප්‍රසාරණය අඩු වීම පිළිබිඹු කරමින් දේශීය ආර්ථික කටයුතුවල වර්ධනය අඩු වීම, දේශීය ක්‍රියාකාරකම් මඟින් ඉපැයූ බදු අදායම අඩු වීමට හේතු විය. ඒ අනුව, 2011 වර්ෂයේ දී ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස සියයට 14.8 ක් වූ මුළු බදු ආදායම 2012 වර්ෂයේ දී සියයට 13.9 දක්වා අඩු විය.

වෙළඳපොළ පොළී අනුපාත සාපේක්ෂව ඉහළ මට්ටමක පැවතීම හා විශේෂයෙන්ම 2012 වර්ෂයේ දෙවන භාගයේ දී දේශීය ණය ගැනීම් වැඩි වීම සහ විනිමය අනුපාත අවප්‍රමාණය වීම හේතුවෙන් 2011 වර්ෂයේ දී රු. බිලියන 357 ක් වූ රජයේ පොළී වියදම 2012 වර්ෂයේ දී රු. බිලියන 408 දක්වා වැඩි විය. කෙසේ වුවත්, 2009 වර්ෂයේ දී ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස සියයට 3.9 ක් වූ රාජ්‍ය ආරක්ෂක වියදම 2012 වර්ෂයේ දී සියයට 2.7 දක්වා අඩු වීම සහ පසුගිය වර්ෂයේ දී ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස සියයට 2.0 ක් වූ අනෙකුත් භාණ්ඩ හා සේවා සඳහා වන වියදම සියයට 1.8 දක්වා අඩු වීම පිළිබිඹු කරමින් පසුගිය වර්ෂයේ දී

ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස සියයට 10.2 ක් වූ පොළී වියදම හැර වර්තන වියදම 2012 වර්ෂයේ දී සියයට 9.5 ක මට්ටමක පවත්වා ගැනීමට හැකි විය. ඒ අනුව, පසුගිය වර්ෂයේ දී ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස සියයට 15.7 ක් වූ වර්තන වියදම සියයට 14.9 ක් දක්වා අඩු කර ගැනීමට හැකි විය. ආදායම අඩු වීමත් සමඟම, 2011 වර්ෂයේ දී ද.දේ.නිෂ්පාදනයෙන් සියයට 0.9 ක් වූ ආදායම් හිඟය සියයට 1.0 දක්වා වැඩි වූ අතර අයවැය හිඟය අපේක්ෂිත මට්ටමෙහි පවත්වා ගැනීම සඳහා ද.දේ.නිෂ්පාදනයෙන් සියයට 6.6 ක් ලෙස 2012 අයවැය මඟින් ඇස්තමේන්තු කළ රාජ්‍ය ආයෝජන ප්‍රමාණය සියයට 5.9 ක මට්ටමක පවත්වා ගැනීමට සිදු විය.

2012 වර්ෂය තුළ දී බදු ප්‍රතිපත්තීන් හි වෙනස්කම් කිහිපයක් සිදු කරන ලදී. ජාත්‍යන්තර වෙළෙඳපොළේ ඛනිජ තෙල් මිල ගණන් අඩු වීමත් සමඟම ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය සඳහා ලබා දී තිබූ සම්පූර්ණ තීරු බදු කපා හැරීම් 2012 වර්ෂයේ මුල් භාගය තුළ දී අඩු කරන ලදී. එසේම, දේශීය නිෂ්පාදනය දිරිගැන්වීම සඳහා කිරිපිටි ආනයනය සඳහා ලබා දී තිබූ සම්පූර්ණ තීරු බදු කපා හැරීම් ද අඩු කරන ලදී. තවද, මෝටර් රථ වාහන අමතර කොටස් ආනයනයේ දී අය කරනු ලබන ආනයන බද්ද වැඩි කරන ලදී. ජාත්‍යන්තර වෙළඳපොළේ මිල ගණන් වෙනස් වීම හා දේශීය සැපයුම සලකා බලමින් විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද වරින් වර සංශෝධනය කළ අතර විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ගෙවීමට යටත් වන භාණ්ඩ අතරට ආනයනය කරනු ලබන එළවළු තෙල් සහ මාළු වැනි පාරිභෝගික භාණ්ඩ කිහිපයක් අලුතින් හඳුන්වා දෙන ලදී. මේ අතර දේශීයව අගය එකතු කළ වටිනාකම වැඩි කිරීම සඳහා හා රාජ්‍ය ආදායම වැඩි කිරීම සඳහා ආනයනය කරනු ලබන භාණ්ඩ කිහිපයකට අදාළ වූ සෙස් බදු වැඩි කරන ලදී. මෙම ක්‍රියාමාර්ග මඟින් දේශීය නිෂ්පාදනයන් හි අගය එකතු කිරීම වැඩි කිරීම සඳහා යහපත් බලපෑමක් ඇති විය. තවද, 2012 වර්ෂය තුළ දී සැර මත්පැන් සහ බීර සඳහා වන සුරා බද්ද අවස්ථා දෙකක දී වැඩි කරන ලද අතර දුම්වැටි සඳහා වන නිෂ්පාදන බද්ද ද වැඩි කරන ලදී. මෙම ක්‍රියාමාර්ග මඟින් රාජ්‍ය ආදායමට සහ දේශීය නිෂ්පාදනයේ අගය එකතු කිරීම සඳහා යහපත් බලපෑමක් ඇතිවිය. කෙසේ වුවත්, වැඩි වන වෙළඳ ශේෂය පාලනය කිරීම සඳහා වාහන ආනයනය සඳහා අදාළ වන නිෂ්පාදන බද්ද වැඩි කිරීමෙන් රාජ්‍ය ආදායමෙහි වර්ධනයට අයහපත් බලපෑමක් ඇති විය. එසේම දුම්වැටි හා මත්පැන්වලට අදාළ නිෂ්පාදන බදු හා සුරා බදු ඉහළ අගයක පැවතීම දේශීය ඉල්ලුම අධෛර්යමත් කිරීමට සහ ආදායමෙහි වර්ධනය අඩු කිරීමට හේතු විය.

2012 වර්ෂයේ වර්තන වියදම රු. බිලියන 1,131 ක් වූ අතර 2011 වර්ෂය හා සැසැඳීමේ දී එය සියයට 10.4 ක වැඩි වීමකි. 2011 වර්ෂයේ දී රු. බිලියන 357 ක් වූ පොළී වියදම 2012 වර්ෂයේ දී රු. බිලියන 408 ක් වූ අතර එය මුළු වර්තන වියදමින් සියයට 36.1 ක් විය. කෙසේ වෙතත්, ද.දේ.නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස එය සියයට 5.5 සිට 5.4 දක්වා අඩු විය. 2011 වර්ෂයේ දී ගෙවුම් ශේෂයේ අස්ථාවරතාවයන් ඇති වීම හා විනිමය අනුපාතය නම්‍යශීලී නොවීම හේතුවෙන් ඇති වූ තත්ත්වයන් පාලනය කිරීම සඳහා විනිමය අනුපාතය

අවප්‍රමාණය වීම හා පොළී අනුපාත වැඩි කිරීම, මුළු විදේශීය ණය ප්‍රමාණයෙහි සහනදායී ණය ප්‍රමාණය අඩු වීම මෙන්ම රාජ්‍ය ආදායමෙහි වර්ධනය අඩු වීම නිසා ණය ලබා ගැනීමට සිදු වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. වැටුප් වැඩි කිරීම සහ රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම අඛණ්ඩව සිදු කරමින් තිබියදීත් 2011 වර්ෂයේ රු. බිලියන 668 ක් වූ පොළී ගෙවීම් හැර වර්තන වියදම 2012 වර්ෂයේ දී රු. බිලියන 723 ක් වූ අතර එය සියයට 8.1 ක වැඩි වීමකි. 2011 වර්ෂයේ දී රු. බිලියන 43.4 ක් වූ රාජ්‍ය ආරක්ෂක කටයුතුවලට අදාළ අනෙකුත් භාණ්ඩ හා සේවා මතවන වියදම 2012 වර්ෂයේ දී රු. බිලියන 32.6 දක්වා අඩු වීම වර්තන වියදම අඩු කර ගැනීමට උපකාරී විය. රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ශක්තිමත් කිරීම සඳහා වියදම් තාර්කිකරණය කිරීම සඳහා වන රජයේ උත්සාහයන් පිළිබිඹු කරමින් 2012 වර්ෂයේ දී වර්තන වියදමෙහි වර්ධනය ද.දේ.නිෂ්පාදිතයේ නාමික වර්ධනයට වඩා අඩු වීම හේතුවෙන් 2011 වර්ෂයේ දී ද.දේ.නිෂ්පාදිතයෙන් සියයට 15.7 ක් වූ වර්තන වියදම 2012 වර්ෂයේ දී සියයට 14.9 ක් දක්වා අඩු විය.

පොළී නොවන වර්තන වියදම පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 8.1 කින් වැඩි වුවද ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස සියයට 10.2 සිට සියයට 9.5 දක්වා අඩු විය. සියළුම රජයේ සේවකයන් සඳහා ලබා දෙනු ලබන, ඔවුන්ගේ මූලික වටුපෙන් සියයට 5 ක් වූ විශේෂ දීමනාව, රු.1,200 ක මාසික අවම වැටුප් වැඩි වීමකට යටත්ව, මූලික වැටුපෙන් සියයට 15 දක්වා වැඩි කිරීම සහ ග්‍රාම නිලධාරිවරු, අධිකරණ නිලධාරීන්, වෛද්‍යවරුන්, ඉංජිනේරුවරුන් සහ විශ්වවිද්‍යාල සේවක මණ්ඩල සඳහා ලබා දෙනු ලබන විවිධ දීමනා වැඩි කිරීම හේතුවෙන් වැටුප් හා වේතන සඳහා වියදම රු. බිලියන 320 සිට රු. බිලියන 348 දක්වා සියයට 8.8 කින් වැඩි විය. විශ්‍රාමිකයින් සඳහා ලබා දෙන මාසික දීමනාව රු. 1,000 කින් වැඩි කිරීම සහ 2011 වර්ෂයේ දී පුද්ගලයන් 23,447 දෙනෙකු ද 2012 වර්ෂයේ දී පුද්ගලයන් 17,375 දෙනෙකු ද විශ්‍රාම වැටුප් ප්‍රතිලාභීන් ලෙස අලුතෙන් එකතු වීම හේතුවෙන්, 2011 වර්ෂයේ දී රු. බිලියන 100 ක් වූ විශ්‍රාම වැටුප් වියදම, 2012 වර්ෂයේ දී රු. බිලියන 112 දක්වා සියයට 11.7 කින් වර්ධනය විය. ඒ අනුව, 2011 වර්ෂයේ දී රු. බිලියන 420 ක් වූ වැටුප් හා විශ්‍රාම වැටුප් වියදම 2012 වර්ෂයේ දී රු. බිලියන 460 ක් විය.

රජය විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලබන සමාජ සුභසාධන වැඩසටහන් සඳහා වියදම 2012 වර්ෂයේ දී රු. බිලියන 39.7 ක් වූ අතර එයින් රු. බිලියන 14.8 ක් ආබාධිත රණවිරුවන් සඳහා ද රු. බිලියන 10.6 ක් සමෘද්ධි ආධාර වශයෙන් ද රු. බිලියන 7.0 ක් පාසැල් නිල ඇඳුම් හා පෙළ පොත් ලබා දීම සහ පෝෂණ වැඩසටහන් වෙනුවෙන් ද රු. බිලියන 7.3 ක් සහන ලැබිය යුතු සමාජයේ විවිධ ජනකොටස් සඳහා සහන ලබා දීමට හා අනෙකුත් සුභසාධන කටයුතු සඳහා ද වැය කරන ලදී. ප්‍රධාන වශයෙන් වැටුප් හා වේතන ගෙවීම් වැඩි වීම හේතුවෙන් රාජ්‍ය ආයතන සඳහා සිදු කරන ලද පැවරුම් රු. බිලියන 34.9 ක් වූ අතර එයින් රු. බිලියන 11.1 ක් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, තැපැල් දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය යන ආයතනවල මෙහෙයුම් අලාභ පියවීම සඳහා විය.

ද.දේ.නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ආයෝජන වාර්ෂිකව සියයට 6 ක මට්ටමක පවත්වා ගැනීම සඳහා කැපවෙමින්, ආදායම් අඩු වීම ඇතුළුව පැවති අහිතකර මූල්‍ය තත්ත්වය යටතේ වුව ද 2011 වර්ෂයේ රු. බිලියන 422 ක් වූ රාජ්‍ය ආයෝජන වියදම 2012 වර්ෂයේ දී රු. බිලියන 444 ක් දක්වා වැඩි වූ අතර එය ද.දේ.නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 5.9 ක් විය. 2005-2012 කාල පරිච්ඡේදය තුළ දී ද.දේ.නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ආයෝජනවල සාමාන්‍ය අගය සියයට 6.2 ක මට්ටමක පවත්වා ගැනීමට රජයට හැකි වූ අතර 2002-2004 කාල පරිච්ඡේදය තුළ දී එය සියයට 4.7 ක් විය. රාජ්‍ය ආයෝජන සඳහා වන වියදම තිරසාරව පවත්වා ගැනීමේ ප්‍රතිලාභ ලබමින් බලශක්ති උත්පාදනය, වරාය හා ගුවන්තොටුපොළ, අධිවේගී මාර්ග, මහා මාර්ග, ජාතික වාරිමාර්ග පද්ධතිය, සනීපාරක්ෂක හා ජල පහසුකම් සැපයීමේ කටයුතු, පාසැල්, වෘත්තීය පුහුණු ආයතන, විශ්ව විද්‍යාල, රෝහල් සහ සේවා සැපයීමේ පහසුකම් අඛණ්ඩව වර්ධනය වී ඇත. ඒ අනුව, 2002 වර්ෂයේ දී මෙ.වො. 2,231 ක් වූ බලශක්ති උත්පාදන ධාරිතාව 2012 වර්ෂයේ දී මෙ.වො. 3,312 දක්වා ද, 2002 වර්ෂයේ දී පැවති වරායන් සංඛ්‍යාව තුනක් වූ අතර එය 2012 වර්ෂයේ දී වරායන් පහක් දක්වා ද, රට තුළ ගුවන්තොටුපළ පහසුකම් ව්‍යාප්ත කිරීමත් සමඟම 2002 වර්ෂයේ දී එක් ජාත්‍යන්තර ගුවන්තොටුපළක් පමණක් පැවතිය ද 2012 වර්ෂයේ දී ජාත්‍යන්තර ගුවන්තොටුපළ දෙකක් දක්වා ද, 2002 වර්ෂයේ දී වර්ග කිලෝමීටරයකට කිලෝමීටර 1.68 ක් වූ මාර්ග ඝනත්වය 2012 වර්ෂයේ දී වර්ග කිලෝමීටරයකට කිලෝමීටර 1.76 දක්වා ද 2005 වර්ෂයේ දී ඝන මීටර් 253 ක් වූ ජල සැපයුම් ධාරිතාව 2012 වර්ෂයේ දී ඝන මීටර් 368 දක්වා ද වර්ධනය විය. මෙම ආයෝජන වැඩසටහන්වල ප්‍රගතිය පෙන්නුම් කරමින් විදුලිය සැපයුම සියයට 93 දක්වා ද පිරිසිදු පානීය ජල සැපයුම සියයට 84 දක්වා ද වැඩි වූ අතර මහජනතාවට සපයන ප්‍රවාහන, අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම් විශාල වශයෙන් වැඩි වී ඇත.

ආදායම් ගිණුමේ හිඟය, එනම් සමස්ත ආදායම සහ සමස්ත පුනරාවර්තන වියදම අතර වෙනස, 2012 වර්ෂයේ දී රු. බිලියන 79.6 ක් වූ අතර එය 2011 වර්ෂයේ දී රු. බිලියන 57 ක් විය. ද.දේ.නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 2011 වර්ෂයේ දී සියයට 0.9 ක් වූ ආදායම් හිඟය 2012 වර්ෂයේ දී සියයට 1.0 දක්වා වැඩි විය. ආනයන අඩු වීම සහ බදු ආදායම සඳහා පදනම් වන දේශීය ආර්ථික කටයුතුවල වර්ධනය අඩුවීම හේතුවෙන් ආදායම අඩු වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මේ සමඟම රාජ්‍ය ආයෝජන රු. බිලියන 444 ක් එනම් ද.දේ.නිෂ්පාදිතයෙන් සියයට 5.9 ක මට්ටමක පවත්වා ගැනීම හේතුවෙන් 2011 වර්ෂයේ දී රු. බිලියන 450 ක් වූ සමස්ත අයවැය හිඟය 2012 වර්ෂයේ දී රු. බිලියන 489 ක් විය. කෙසේ වෙතත්, ද.දේ.නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 2009 වර්ෂයේ සියයට 9.9 ක්, 2010 වර්ෂයේ දී සියයට 8.0 ක් හා 2011 වර්ෂයේ දී සියයට 6.9 ක් වූ අයවැය හිඟය 2012 වර්ෂයේ දී සියයට 6.4 දක්වා අඩු කිරීමට හැකි විය. රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ ප්‍රගතිය පෙන්නුම් කරමින් හතරවන අනුගාමී වර්ෂයේදීත් අයවැය හිඟය අඛණ්ඩව අඩු වී ඇත. අයවැය හිඟය මූල්‍යනය සඳහා රු. බිලියන 308 ක් (මුළු මූල්‍යනයෙන් සියයට 63 ක් එනම්

ද.දේ.නිෂ්පාදිතයෙන් සියයට 4.1 ක්) දේශීය ශුද්ධ ණය ගැනීම් විය. 2012 වර්ෂයේ දේශීය ශුද්ධ මූල්‍යනය සඳහා රාජ්‍ය සුරැකුම්පත්වල අනේවාසික ආයෝජනය රු. බිලියන 25 ක් විය. අයවැය හිඟයේ ශුද්ධ මූල්‍යනයේ ශේෂය වන රු. බිලියන 181 (මුළු මූල්‍යනයෙන් සියයට 37 ක් එනම් ද.දේ.නිෂ්පාදිතයෙන් සියයට 2.4 ක්) විදේශීය මූලාශ්‍ර මඟින් ලබා ගන්නා ලදී.

2012 වර්ෂය අවසන් වන විට රාජ්‍ය ණය රු. බිලියන 6,000.1 ක් විය. මුළු රාජ්‍ය ණය ප්‍රමාණයෙන් දේශීය ණය රු. බිලියන 3,232.8 ක් හා විදේශීය ණය රු. බිලියන 2,762.2 ක් විය. ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස සමස්ත ණය ප්‍රමාණය, 2002 වර්ෂයේ දී පැවති සියයට 105.6 ක ඉහළම අගයට හා 2011 වර්ෂයේ පැවති සියයට 78.5 ට සාපේක්ෂව 2012 වර්ෂයේ දී සියයට 79.1 ක් විය. පසුගිය වර්ෂයේ ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස සියයට 6.9 ක් වූ අයවැය හිඟය සියයට 6.4 ක් දක්වා අඩු කිරීම, 2011 වර්ෂයේ දී සියයට 8.2 ක් වූ ආර්ථික වර්ධන වේගය 2012 වර්ෂයේ දී සියයට 6.4 ක් දක්වා අඩු වීම, ප්‍රධාන විදේශ විනිමය වර්ගවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමෙන් ඇති වූ බලපෑම රු. බිලියන 207.4 ක් වීම සහ 2011 වර්ෂයේ දී ඇ.ඩො. බිලියන 17.3 වූ විදේශ ව්‍යවහාර මුදලින් සමන්විත විදේශීය ණය ප්‍රමාණය 2012 වර්ෂයේ දී ඇ.ඩො. බිලියන 18.6 දක්වා වැඩි වීම මේ සඳහා හේතු විය.

දේශීය මුළු ණය ප්‍රමාණය 2012 වර්ෂයේ දී රු. බිලියන 428.8 කින් වැඩි වූ අතර එය සාපේක්ෂ ණය ප්‍රමාණයෙන් සියයට 53.9 ක් විය. කෙසේ වුවත්, ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස දේශීය ණය ප්‍රමාණය පසුගිය වර්ෂයේ පැවති සියයට 42.8 ට සාපේක්ෂව සියයට 42.6 දක්වා අඩු විය. වසර 02 කට වඩා කල්පිරීමක් සහිත දේශීය ණය ප්‍රමාණය රු. බිලියන 2,419.6 ක් වූ අතර එය මුළු දේශීය ණය ප්‍රමාණයෙන් සියයට 74.8 ක් වේ. මුළු දේශීය ණය ප්‍රමාණයේ ඉතිරි සියයට 25.2 ක ශේෂය එනම් රු. බිලියන 813.3 වසර 01 ට වඩා අඩු කල් පිරීමක් සහිත කෙටි කාලීන භාණ්ඩාගාර බිල්පත් වේ. 2012 වර්ෂය අවසන් වන විට විදේශීය මුළු ණය ප්‍රමාණය සමස්ත ණය ප්‍රමාණයෙන් සියයට 46.1 ක් විය. රජයේ ප්‍රාග්ධන වියදම් සඳහා වැඩි වශයෙන් විදේශ අරමුදල් යොදා ගැනීම සහ ප්‍රධාන ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීම යන කරුණු හේතුවෙන් 2012 වර්ෂයේ දී විදේශීය ණය රු. බිලියන 438 කින් වැඩි විය. ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස ද එය 2011 වර්ෂයේ දී පැවති සියයට 35.6 සිට සියයට 36.5 දක්වා වැඩි විය. විදේශ විනිමය විචලනය වීමේ බලපෑම රු. බිලියන 207.4 ක් වූ අතර ඒ සඳහා විදේශ මුදලින් ණය ගැනීම සිදු නොවන අතර අයවැය මඟින් දේශීය මුදලින් මූල්‍යනය කිරීම සිදුවේ.

1.1. රජයේ ආදායම

2012 වර්ෂයේ මුළු ආදායම රු. බිලියන 1,051.5 ක් වු අතර එය 2011 වර්ෂයේ වූ රු. බිලියන 967.9 ට සාපේක්ෂව සියයට 8.6 ක වර්ධනයකි. 2012 වර්ෂයේ තත්‍ය ආදායම ඇස්තමේන්තුගත ආදායමට වඩා අඩු වුවද බදු ආදායම රු. බිලියන 908.9 දක්වා ද (සියයට 7.5 වර්ධනයක්) බදු නොවන ආදායම රු. බිලියන 142.5 දක්වා ද (සියයට 16.7 ක වර්ධනයක්) වැඩිවීම සමස්ත ආදායම වැඩි වීම සඳහා හේතු වී ඇත.

සාර්ව ආර්ථික ස්ථායීතාවය පවත්වාගෙන යාම සඳහා දේශීය ඉල්ලුම වැඩිවීම පාලනය කිරීමට සහ ඇතැම් භාණ්ඩ ආනයනය සාපේක්ෂව අඩු කිරීම තුළින් වෙළඳ ශේෂයේ හිඟය වැඩිවීම පාලනය කිරීමට තෝරාගත් භාණ්ඩවල ආනයනය අඩු කිරීමට ආනයන බදු වැඩි කිරීම, පොළී අනුපාත වැඩි කිරීම, විනිමය අනුපාතිකය ලිහිල් කිරීම වැනි ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග 2012 වර්ෂයේ මුල් භාගය තුළදී රජය විසින් හඳුන්වා දීමෙන් ඇති වූ බලපෑම ආදායම් කාර්ය සාධනය සලකා බැලීමේ දී සැලකිල්ලට ගත යුතු වේ. 2012 වර්ෂය තුළ දී මෝටර රථ ආනයනය ඇ.ඩො. මිලියන 495 ක් දක්වා සියයට 43.8 කින් ද ආහාර පාන වර්ග ඇ.ඩො. මිලියන 1,304 දක්වා සියයට 16.9 කින් අඩු වීම ද ඇතුළත්ව පාරිභෝගික භාණ්ඩ ඇ.ඩො. මිලියන 2,995 ක් දක්වා සියයට 18.0 කින් ද අඩු විය. මේ අනුව, 2012 වර්ෂයේ දී මුළු ආනයන 2011 වර්ෂයේ වූ ඇ.ඩො. බිලියන 20.3 ට සාපේක්ෂව ඇ.ඩො. බිලියන 19.2 දක්වා අඩු වී ඇත. කෙසේ වෙතත්, ආයෝජන හා ඉදිකිරීම් ක්‍රියාවලීන්හි මෑත කාලීනව ඇති වූ වර්ධනය හේතුවෙන් ආයෝජන භාණ්ඩ ආනයනය ඇ.ඩො. මිලියන 4,590 දක්වා සියයට 7 කින් වැඩි වී ඇති අතර ඛනිජ තෙල් ආනයනය සියයට 5 කින් ඇ.ඩො. මිලියන 5,037 දක්වා වැඩි වුවද අතරමැදි භාණ්ඩ ආනයනය ඇ.ඩො. මිලියන 11,570 දක්වා සියයට 5.7 කින් ආන්තිකව වැඩි වී ඇත. තවද, ඉහත ක්‍රියාමාර්ගවල බලපෑමෙන් මෙන්ම දුර්වල ගෝලීය ආර්ථික තත්ත්වය මධ්‍යයේ 2011 දී ඇ.ඩො. බිලියන 10.5 ක් වූ අපනයන ආදායම 2012 දී ඇ.ඩො. බිලියන 9.8 දක්වා අඩු වීමෙන්, නිෂ්පාදන අංශය 2011 වර්ෂයේ වාර්තා කළ සියයට 7.9 ක වර්ධනයට සාපේක්ෂව 2012 වර්ෂයේ දී සියයට 5.2 ක අඩු වර්ධනයක් ලබා ඇත. ඒ අනුව, දේශීය වෙළඳ සේවා ද 2011 දී පෙන්නුම් කළ සියයට 7.5 ක වර්ධනයට සාපේක්ෂව 2012 වර්ෂයේ දී සියයට 6.8 ක මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කර ඇත. 2011 වර්ෂයේ දී සියයට 8.2 ක්වූ ද.දේ.නිෂ්පාදනයේ වර්ධනය 2012 දී සියයට 6.4 දක්වා අඩු වීම, දේශීය ඉල්ලුම, නිෂ්පාදනය, වෙළඳ කටයුතු හා භාණ්ඩ ප්‍රවාහනය අඩු වීමත් සමඟම බදු අයවන ආනයන අඩු වීම රාජ්‍ය ආදායමෙහි වර්ධනයට අහිතකර ලෙස බලපා ඇත. 2011 දී මුළු ආදායම ද.දේ.නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 14.8 ක් වූ අතර එය 2012 දී සියයට 13.9 ක් විය. විශේෂයෙන්ම ද.දේ.නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස 2011 වර්ෂයේ දී සියයට 12.9 ක් වූ බදු ආදායම 2012 වර්ෂයේ දී සියයට 12.0 ක් විය.



1.2. රාජ්‍ය ආදායමේ විචලතා විශ්ලේෂණය - 2012 (රු. බිලියන)

අයිතමය	2011 (සත්‍ය)	2012 (තාවකාලික)	බලපාන ලද කරුණු
ආදායම් බදු	157,310	172,593	වැඩිවන වෙළඳ හිඟය පාලනය කිරීම සඳහා ප්‍රතිපත්ති පොළී අනුපාත වැඩි කිරීම, බැංකු මගින් පුද්ගලික අංශයට ලබා දෙන ණය ප්‍රසාරණය වීම පාලනය කිරීම සඳහා සීමාවන් පැනවීම සහ විනිමය අනුපාත ලිහිල් කිරීම හේතුවෙන් නිෂ්පාදන කර්මාන්ත, සංනිවේදන, රක්ෂණ සහ කල්බදු පහසුකම් සැපයීම වැනි ආදායම් බදු උපදවන ක්ෂේත්‍රවල වර්ධනය අඩු වීම, ඇස්තමේන්තුගත ආදායමට වඩා ආදායම් බදු අඩු වීමට හේතු විය. රාජ්‍ය සේවකයින් උපයන විට බදු ගෙවීමට යටත් කිරීම සහ භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවල ආයෝජනය වැඩි වීම හා පොළී අනුපාත වැඩි වීම හේතුවෙන් පොළී මත රඳවා ගැනීමේ බදු ආදායම වැඩි වීම හේතුවෙන් 2011 වර්ෂයට සාපේක්ෂව ආදායම් බදු ආදායම වැඩි විය.
එකතු කළ අගය මත බදු	225, 858	229,604	වෙළඳ ශේෂයේ හිඟය වැඩිවීම පාලනය කිරීම සඳහා ගනු ලැබූ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හේතුවෙන් එකතු කළ අගය මත බදු අයවන ආනයන අඩු වීමෙන් ඇස්තමේන්තුගත ආදායමට වඩා ආනයන මගින් ඉපැයූ එකතු කළ අගය මත බදු ආදායම අඩු වූ අතර දේශීය ආර්ථික ක්‍රියාකාරකම් අඩුවීම හේතුවෙන් දේශීය සැපයුම් මගින් ඉපැයූ එකතු කළ අගය මත බදු ආදායම ඇස්තමේන්තුගත ආදායමට වඩා අඩු විය. කෙසේ වෙතත්, හෝටල්, ආපනශාලා හා ආහාර පාන සැපයීමේ සේවා වැනි ඇතැම් ක්ෂේත්‍ර වැඩි

			දියුණු වීම සහ සරළ එකතු කළ අගය මත බදු ක්‍රමය (SVAT) හඳුන්වාදීම තුළින් එකතු කළ අගය මත බදු මුදල්වලින් ආපසු ගෙවීම අඩු වීම හේතුවෙන් 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේ බදු ආදයම වැඩි විය.
නිෂ්පාදන බදු / සුරා බදු	204,821	223,960	දුම්වැටි අලෙවිය, මත්පැන් නිෂ්පාදනය සහ මෝටර් වාහන ආනයනය අඩු වුව ද එම භාණ්ඩ සඳහා අදාළ වන නිෂ්පාදන/සුරා බදු වැඩි කිරීම හා පෙට්‍රල් සහ ඩීසල් ආනයනය සඳහා ලබා දී තිබූ තීරු බදු කපා හැරීම අඩු කිරීම ඇස්තමේන්තුගත ආදායම උපයා ගැනීමට උපකාරී විය.
ආනයන බදු	79,811	80,155	ආනයන බදු අයවන ආනයන අඩු වීමත් ජාත්‍යන්තර වෙළඳපොලේ තෙල් මිල ගණන් වැඩි වීම නිසා පෙට්‍රල් සහ ඩීසල් සඳහා ලබා දී තිබූ ආනයන බදු කපා හැරීම්වලින් කොටසක් පවත්වා ගැනීම, එළවළු තෙල් සහ මාළු වැනි ඇතැම් භාණ්ඩ විශේෂ වෙළඳ භාණ්ඩ බද්දට යටත් කිරීම ආනයන බදු ආදායම ඇස්තමේන්තුගත ආදායමට වඩා අඩු වීමට හේතු විය. කෙසේ වෙතත්, ටයර් සහ කිරිපිටි සඳහා වන ආනයන බදු සංශෝධනය කිරීම, 2011 වර්ෂයේ දී පෙට්‍රල් සහ ඩීසල් සඳහා ලබා දී තිබූ සම්පූර්ණ තීරු බදු කපා හැරීම 2012 වර්ෂයේ දී අඩු කිරීම 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේ බදු ආදායම වැඩි වීමට හේතු විය.
වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බදු	66,028	70,111	සමස්තයක් ලෙස ආනයන අඩු වීම ඇස්තමේන්තුගත ආදායමට වඩා සත්‍ය ආදායම අඩු වීමට හේතු විය. මෙලෙස ආනයන අඩු වුව ද වරාය හා ගුවන්තොටුපල බදු ආදායම ශක්තිමත් වීම සහ මෙම බදු ගෙවීමෙන් නිදහස් කිරීම් අඩු වීම හේතුවෙන් 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේ බදු ආදායම වැඩි විය.
ජාතිය ගොඩනැගීමේ බද්ද	35,667	38,736	කර්මාන්තශාලා වලට අදාළ කර්මාන්තවල වර්ධනය අඩුවීමත් ආනයන අඩුවීමත් ජාතිය ගොඩනැගීමේ බදු ආදායම ඇස්තමේන්තුගත ආදායමට වඩා අඩු වීමට හේතු විය. සංචාරක ක්ෂේත්‍රයේ පිබිදීමත් සමගම හෝටල්, ආපනශාලා හා ආහාර පාන සැපයීම වැනි ක්ෂේත්‍රවල වර්ධනය සාපේක්ෂව වැඩි වීම සහ රක්ෂණ සහ බැංකු ක්ෂේත්‍රයේ වර්ධනය 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේ බදු ආදායම වැඩි වීමට හේතු විය.
අනිකුත් බදු	76,202	93,754	ආර්ථිකයට ඇති වූ අයහපත් බලපෑම මධ්‍යයේ වුවද, විශේෂ වෙළඳ භාණ්ඩ බදු හා සෙස් බදු සංශෝධනය කිරීම හා විශේෂ වෙළඳ භාණ්ඩ බදු ගෙවීමට අළුතින් භාණ්ඩ එකතු කිරීම හේතුවෙන්

			ඇස්තමේන්තුගත ආදායම උපයා ගැනීමට හැකි විය. විශේෂ වෙළඳ භාණ්ඩ බදු හා සෙස් බදු සංශෝධනය කිරීම හා විදුලි සංදේශ ක්ෂේත්‍රයේ පුළුල් වීමත් සමගම විදුලි සංදේශ බදු ආදායම වැඩි වීම 2011 වසරට වඩා 2012 වර්ෂයේ ඉහළ බදු ආදායමක් ලබා ගැනීමට උපාකරි විය.
බදු නොවන ආදායම	122,165	142,547	විදේශ සංචිත කළමනාකරණය කිරීම මඟින් ලද ආදායම සහ පොළී අනුපාත වැඩිවීමත් සමඟම භාණ්ඩාගාර බිල්පත් මඟින් ඉපැයූ ආදායම වැඩි වීම හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලාභ හා ලාභාංශ පැවරීම වැඩි වීම ඇස්තමේන්තුගත ආදායමට වඩා සත්‍ය ආදායම වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. ලංකා ඛනිජ වැලි සමාගම, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සහ ජාතික රක්ෂණ භාර අරමුදල වැනි ආයතන සහ රාජ්‍ය බැංකු මඟින් ලාභ පැවරීම වැඩි වීමද 2011 වර්ෂයට වඩා බදු නොවන ආදායම වැඩි වීමට හේතු විය.

2. 2012 වසරේ කාර්ය සාධනය

2.1. ආදායම් රැස් කිරීමේ කාර්යයෙහි නිරත සියලු දෙපාර්තමේන්තු සමග මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් රජයේ ආදායම් වර්ධනය කර ගැනීමට ක්‍රියා කිරීම

2012 වර්ෂයේ මුළු රාජ්‍ය ආදායම රු. බිලියන 1,051.5කි. එය 2011 වර්ෂයේ රු. බිලියන 967.9 හා සැසඳීමේ දී සියයට 8.6 ක වැඩිවීමකි. මුළු රාජ්‍ය ආදායමෙන් බදු ආදායම රු. බිලියන 908.9 ක් වූ අතර බදු නොවන ආදායම රු. බිලියන 142.5ක් විය.



2.2. රාජ්‍ය ආදායම් සාරාංශය

රු. මිලියන

	2011	2012
බදු ආදායම	**845,697**	**908,913**
ආදායම් බදු	157,310	172,593
එකතු කළ අගය මත බදු	225,858	229,604
ජාතිය ගොඩනැඟීමේ බදු	35,667	38,736
නිෂ්පාදන බදු	204,821	223,960
ආනයන බදු	79,811	80,155
වරාය හා ගුවන් තොටුපොල සංවර්ධන බදු	66,028	70,111
විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු	15,622	33,666
අනෙකුත්	60,580	60,088
බදු නොවන ආදායම	**122,165**	**142,547**
පොලී / කුලී	13,426	11,686
ලාභ සහ ලාභාංශ	34,351	46,761
විකුණුම් සහ ගාස්තු	37,292	26,019
සමාජ ආරක්ෂණ දායකත්වය	12,628	11,738*
මහ බැංකු ලාභ පැවරුම්	22,000	43,000
අනෙකුත්	2,468	3,343
මුළු ආදායම	**967,861**	**1,051,460**

****2012 වර්ෂය තුළ සමාජ ආරක්ෂණ දායකත්ව මුදල් ලෙස පළාත් සභා මගින් ලැබිය යුතු රු. මිලියන 1,955 ක මුදල මෙහි ඇතුලත් නොවේ.***

2.3. රජය විසින් වරින්වර ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට අනුකූලව බදු සම්බන්ධ නීතීන්ට සිදු කරන ලද සංශෝධන

2.3.1. මෙම දෙපාර්තමේන්තුව විසින් 2012 වසර තුළදී නිකුත් කරන ලද ගැසට් නිවේදන

(i) නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත

- 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත (2012.02.27 දිනැති 1747/01 දරන ගැසට් නිවේදනය) - තෝරා ගත් නිෂ්පාදන බද්දට යටත් මෝටර් රථ / අයිතම සඳහා නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්දෙන් නිදහස් කිරීම සහ නිශ්චිතව සඳහන් නිෂ්පාදන බද්දට යටත් අයිතම සඳහා නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු ගෙවීමේ දී නිශ්චිත සහනයන් ප්‍රදානය කිරීම

- 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත (2012.03.30 දිනැති අංක 1751/28 දරන ගැසට් නිවේදනය) - පුද්ගලයන් ප්‍රවාහනය කරන මෝටර් වාහන සහ නිශ්චිතව සඳහන්, භාණ්ඩ ප්‍රවාහනය කිරීමට යොදා ගන්නා මෝටර් වාහන සඳහා නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද ඉහළ නැංවීම

- 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත (2012.10.05 දිනැති අංක 1778/40 දරන ගැසට් නිවේදනය) - සිගරැට් සහ අනෙකුත් දුම්කොළ වලින් නිෂ්පාදිත ද්‍රව්‍ය මත පනවා ඇති නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු ඉහළ නැංවීම

- 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත (2012.11.08 දිනැති අංක 1783/19 දරන ගැසට් නිවේදනය) - සිගරැට් සහ අනෙකුත් දුම්කොළ වලින් නිෂ්පාදිත ද්‍රව්‍ය, මෝටර් වාහන සහ අනෙකුත් භාණ්ඩ සඳහා නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු ඉහළ නැංවීම

(ii) සෙස් බදු

- 1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනත (2012.06.13 දිනැති අංක 1762/29 දරන ගැසට් නිවේදනය) - කළු ගල් අපනයනය සඳහා අදාළ වූ සෙස් බද්ද හා ඒකක සංශෝධනය කිරීම සඳහා

- 1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනත (2012.06.27 දිනැති අංක 1764/5 දරන ගැසට් නිවේදනය) - දේශීය නිෂ්පාදකයන් දිරිගැන්වීම සඳහා සහ ගුණාත්මකභාවයෙන් අඩු නිෂ්පාදන ආනයනය සීමාකිරීම සඳහා හිමායිත එළවළු, වියළි එළවළු, අළුත් හෝ වියළි පැඟිරි වර්ගයේ පළතුරු, ජමනාරං, තිරිඟු හෝ මෙස්ලින් පිටි, මෝල්ට් කාරක, යකඩමය ඉවත ලන දෑ සහ සුන්බුන් ආදිය ආනයනය සඳහා පැවති සෙස් බදු සංශෝධනය කිරීම සහ යකඩ හෝ මිශ්‍ර ලෝහ නොවන වානේ වලින් නිම කළ යෂ්ටි, යකඩ වලින් හෝ වානේ වලින් නිමකළ කම්බි, පයිප්ප සහ දඟර සහිත නොනිමි හැඩ කෑලි ආනයනයට අදාළ සෙස් බදු පැනවීම සඳහා

- 1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනත (2012.09.03 දිනැති අංක 1774/3 දරන ගැසට් නිවේදනය) - පෝසිලේන් හා ඒ හා සමාන ද්‍රව්‍ය ඇතුළුව පිඟන් ගඩොල්, සෞඛ්‍යාරක්ෂක උපකරණ (බේසම්, ටැංකි, උක්කුටික පෝච්චි ආදිය), මේස උපකරණ, මුළුතැන්ගෙයි උපකරණ ආදී දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලබන උසස් තත්ත්වයෙන් යුතු දේශීය නිෂ්පාදන ආරක්ෂා කර ගැනීමේ අරමුණින් වටිනාකමින් හා ගුණාත්මකභාවයෙන් අඩු නිෂ්පාදන ආනයනය වැළැක්වීමට එම ආනයනික නිෂ්පාදනවල සෙස් බද්ද වැඩි කිරීම සඳහා රේගු ගුදම් තුළ නිෂ්පාදනය හෝ ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි කර ඇති ආයතන මගින් ආනයන කරනු ලබන සුන්බුන් අපද්‍රව්‍ය සම්බන්ධයෙන් සෙස් බද්ද නිදහස් කිරීම

- 1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනත (2012.11.08 දිනැති අංක 1783/20 දරන ගැසට් නිවේදනය) - දේශීය අගය වැඩි කිරීම දිරිමත් කිරීම සඳහා අඩු අගය එකතු කළ වටිනාකමක් ඇති ඛණිජ අපනයනය හා අමු රබර් අපනයනය සඳහා සෙස් බද්ද වැඩි කිරීම/පැනවීම, තාවකාලික අපනයන පිරිසැකසුම සඳහා වන ආනයනය (TIEP) ක්‍රමය යටතේ හෝ රේගු ගුදම් තුළ නිෂ්පාදනය හෝ ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි කර ඇති ආයතන මගින් ආනයන කරනු ලබන සුන්බුන් අපද්‍රව්‍ය සම්බන්ධයෙන් සෙස් බද්ද නිදහස් කිරීම

- 1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනත (2012.11.08 දිනැති අංක 1783/21 දරන ගැසට් නිවේදනය) - දේශීය වශයෙන් නිෂ්පාදනය කළ හැකි ඇතැම් අයිතමයන් සඳහා සෙස් බද්ද වැඩි කිරීම, දරාගත හැකි මිලකට ස්වකීය භාවිතය සඳහා වෙළෙඳ සන්නම් නාම සහිත ඇතැම් භාණ්ඩ ආනයනය ප්‍රවර්ධනය කිරීම සඳහා ඇතැම් සෙස් බදු අඩු කිරීම, දේශීය නිෂ්පාදකයන්ට ආරම්භයේදී දැරිය යුතු පිරිවැය අඩුකිරීම සඳහා විවිධ අමුද්‍රව්‍යන්හි සෙස් බද්ද අඩුකිරීම/ඉවත් කිරීම, සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවේ යෙදවීම පහසු කිරීම සඳහා ජාතික වැදගත්කමක් ඇති විශේෂිත වූ ව්‍යාපෘති සඳහා භාණ්ඩ ආනයනය සම්බන්ධව සෙස් බද්ද ඉවත් කිරීමට

(iii) **සුරාබදු**

- අංක 947, 948, 949 සහ 950 දරන සුරාබදු නිවේදනය (2012.03.30 දිනැති අංක 1751/29 දරන ගැසට් නිවේදනය) මත්පැන්, ඉක්ෂුපාක, තල්, පොල්, පදම් කළ අරක්කු සහ මෙරට සෑදූ විදේශීය ස්ප්‍රීතු හා ධාන්‍ය මත්පැන් සඳහා වූ සුරාබදු සංශෝධනය කිරීම.

- අංක 951 දරන සුරාබදු නිවේදනය (2012.03.30 දිනැති අංක 1751/30 දරන ගැසට් නිවේදනය) සුරා බදු බලපත්‍රලත් ආයතන විසින් දේශීය වශයෙන් නිෂ්පාදිත ඖෂධීය නිෂ්පාදන, නිෂ්පාදනය කිරීම සඳහා හෝ අනුමත කර්මාන්ත හා වෙනත් කාර්යයන් සඳහා හෝ යොදා ගනු ලබන ස්ප්‍රීතු (ඊතයිල් මද්‍යසාර) මත වන සුරා බද්ද සංශෝධනය කිරීම

- අංක 952, 953, 954 සහ 955 දරන සුරාබදු නිවේදන (2012.10.05 දිනැති අංක 1778/41 දරන ගැසට් නිවේදනය) - වයින්, ඉක්ෂුපාක, තල්, පොල් සහ පදම් කළ අරක්කු, මෙරට සෑදූ විදේශීය ස්ප්‍රීතු හා ධාන්‍ය මත්පැන් සඳහා වූ සුරාබදු සංශෝධනය කිරීමට

- අංක 956 දරන සුරාබදු නිවේදනය (2012.10.05 දිනැති අංක 1778/42 දරන ගැසට් නිවේදනය) - ඖෂධ නිෂ්පාදනය, කර්මාන්ත කටයුතු, අපනයනය සඳහා නිමි භාණ්ඩ නිෂ්පාදනය සඳහා අනුමත ආයතන මගින් යොදා ගනු ලබන (ඊතයිල් මද්‍යසාර) ස්ප්‍රීතු හා අශුද්ධ ඊතයිල් මද්‍යසාර ස්පිතු (කාර්මික ස්ප්‍රීතු / දුර්වල ස්ප්‍රීතු) සඳහා වන සුරාබදු සංශෝධනය කිරීමට

(iv) **වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බද්ද**

- 2011 අංක 18 දරන වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බදු පනත (2012.05.09 දිනැති අංක 1757/3 දරන ගැසට් නිවේදනය)- තෝරා ගනු ලබන ව්‍යවසායකයන් විසින් ආනයනය කරනු ලබන පිරියත, යන්ත්‍ර සූත්‍ර උපකරණ හා ප්‍රවාහන පහසුකම් සපයා දීම සඳහා භාවිතා කරනු ලබන භාණ්ඩ බද්දෙන් නිදහස් කිරීම සහ ඖෂධ නිෂ්පාදනය කිරීම සඳහා භාවිතා කරනු ලබන අමුද්‍රව්‍ය සඳහා වූ බදු සංශෝධනය කිරීමට

- 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු පනත (2012.11.09 දිනැති අංක 1783/34 දරන ගැසට් නිවේදනය) - නොමිලේ වෛද්‍ය සේවා සපයන සෞඛ්‍ය ආයතන සඳහා පරිත්‍යාග කරනු ලබන වෛද්‍ය උපකරණ ආනයනය කිරීමේ දී ගෙවිය යුතු වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද ගෙවීමෙන් නිදහස් කිරීමට, නිශ්චිතව දක්වා ඇති සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක හා සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ ආනයනය කරනු ලබන භාණ්ඩ වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්දෙන් නිදහස් කිරීමට සහ නිශ්චිතව දක්වා ඇති සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක හා සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ අවශ්‍ය ද්‍රව්‍ය ආනයනය සඳහා 2.5% ක සහනදායී වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු අනුපාතයක් ගෙවීම සඳහා බදු සංශෝධනය කිරීමට

(v) මුදල් පනත යටතේ නිවේදන

- 1963 අංක 11 දරන මුදල් පනත (2012.12.28 දිනැති අංක 1790/15 දරන ගැසට් නිවේදනය) - අංක 112, හෝර්ටන් පෙදෙස, කොළඹ 7 යන ස්ථානයේ පිහිටි මූලික සැලැස්ම අනුව හෙක්ටයාර් 0.30926ක් වූ දේපළ චීන සමූහාණ්ඩු තානාපති කාර්යාලයට පැවරීම සම්බන්ධයෙන් 1963 අංක 11 දරන මුදල් පනතේ 58 (4) (උ) වගන්තිය යටතේ වූ නියමය සහ එම වගන්තියේ (1), (2) හා (3) උපවගන්තිවල විධිවිධාන අදාළ නොවිය යුතු බවට ප්‍රකාශයට පත් කිරීම සඳහා

- 2003 අංක 25 දරන මුදල් පනත (2012.12.31 දිනැති අංක 1791/8 දරන ගැසට් නිවේදනය) - 2013 අයවැය යෝජනාවලට අනුව ගුවන් යානයකින් හෝ නැව් මගින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන සෑම තැනැත්තෙකුගෙන්ම අයකරනු ලබන අපගමන බද්ද සංශෝධනය කිරීම සඳහා

(vi) මුද්දර බදු (විශේෂ විධිවිධාන) පනත

- 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත (2012.04.04 දිනැති අංක 1752/17 දරන ගැසට් නිවේදනය)-ශ්‍රී ලංකා රජය වෙත නිකුත් කරනු ලබන කොටස් නිකුතුවක් සම්බන්ධයෙන් වන කොටස් සහතිකයක් මුද්දර ගාස්තුවලින් නිදහස් කිරීම

- 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත (2012.05.09 දිනැති අංක 1752/4 දරන ගැසට් නිවේදනය)-ශ්‍රී ලංකා රජය සතු යම් කොටසක් මාරු කිරීම හෝ පැවරීම සම්බන්ධයෙන් වන යම් කොටස් සහතිකයක් මුද්දර ගාස්තුවලින් නිදහස් කිරීම.

- 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත (2012.10.04 දිනැති අංක 1778/32 දරන ගැසට් නිවේදනය) - සමාගම් දෙකෙහිම හිමිකම ශ්‍රී ලංකා රජය සතු වන අවස්ථාවකදී, සමාගමක් විසින් තවත් සමාගමකට හෝ 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ ඇති සමාගමක් විසින් ශ්‍රී ලංකා රජය සතු සමාගමකට මූලික නිකුතුව ලබා දෙන කොටස් සහතිකයක් මුද්දර ගාස්තුවලින් නිදහස් කිරීම

- 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත (2012.12.17 දිනැති අංක 1789/9 දරන ගැසට් නිවේදනය) - 2013 අයවැය යෝජනාවලට අනුව, දිවුරුම් පෙත්සම්, රක්ෂණ ඔප්පු, නොතාරිස් බලපත්‍ර, වෙළඳමක් හෝ ව්‍යාපාරයක් කරගෙන යාමට නිශ්චිත කාලයක් සඳහා දෙනු ලබන බලපත්‍ර, මද්‍යසාර විකිණීමේ ව්‍යාපාරයක් කරගෙන යාමට නිශ්චිත කාලයක් සඳහා දෙනු ලබන බලපත්‍ර සහ ණය කාඩ් ගනුදෙනු යන සාධන පත්‍රවලට අදාළ මුද්දර ගාස්තු සංශෝධනය කිරීම සඳහා

- 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත (2012.12.18 දිනැති අංක 1789/15 දරන ගැසට් නිවේදනය) - 2013 අයවැය යෝජනාවලට අනුව, යම් තැනැත්තකු විසින් අන්තර් වෙළඳ ගිණුමකට (ප්ලැෂ් ගිණුමකට) හෝ එවැනි ගිණුමක සිට යම් තැනැත්තෙකුට කොටස් පැවරීම මත වූ යම් සාධන පත්‍රයක් මත වූ මුද්දර බද්ද නිදහස් කිරීම සඳහා

(vii) 2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත යටතේ ප්‍රකාශයට පත් කරන ලද ගැසට් නිවේදන

- 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 13 වැනි වගන්තිය යටතේ (2012.05.30 දිනැති 1760/11 දරන ගැසට් නිවේදනය) - 2011 අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව ප්‍රකාශයට පත් කිරීම.

- 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 10 වැනි වගන්තිය යටතේ (2012.06.29 දිනැති 1764/20 දරන ගැසට් නිවේදනය) - 2012 වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව ප්‍රකාශයට පත් කිරීම

- 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 4 සහ 7 වැනි වගන්තිය යටතේ (2012.11.08 දිනැති 1783/22 දරන ගැසට් නිවේදනය) - 2013 රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව ප්‍රකාශයට පත් කිරීම

2.3.2. මෙම දෙපාර්තමේන්තුව විසින් 2012 වසරේදී සිදු කරන ලද පනත් සංශෝධන

- 2012 අංක 7 දරන එකතුකළ අගය මත බදු (සංශෝධන) පනත
- 2012 අංක 8 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත
- 2012 අංක 12 දරන මුදල් (සංශෝධන) පනත
- 2012 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත
- 2012 අංක 11 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත
- 2012 අංක 10 දරන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු පනත

2.4. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳව ගරු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් 2012 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල සංදේශ පත්‍රිකා ඉදිරිපත් කරන ලදී. එසේම, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියට අදාළව ගරු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගේ නිරීක්ෂණ ලබා දිය යුතු අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ පිළියෙල කිරීම ද මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

2.5. විවිධ බදු සම්බන්ධ පනත් කෙටුම්පත් සහ ගැසට් පත්‍ර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සහ ඊට අනුගාමී ක්‍රියා මාර්ග ගැනීම

- බදු පිළිබඳ ව්‍යවස්ථාවන් සංශෝධනය කිරීම සම්බන්ධයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ නීති කටයුතු දෙපාර්තමේන්තුව, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව, ගරු නීතිපතිතුමා, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා, රජයේ මුද්‍රණාලය සහ පාර්ලිමේන්තුව සමග සහයෝගයෙන් කටයුතු කරමින් අදාළ කටයුතු සිදු කරන ලදී.

- බදු/ගාස්තු ප්‍රතිශෝධනයට අදාළ ගැසට් නිවේදනයන් 2012 වසර තුළ ප්‍රකාශයට පත් කරන ලදී.

2.6 සියලු ආදායම් ප්‍රභවයන් සමාලෝචනය කිරීම, ආදායම් පිළිබඳ දත්ත එක්රැස් කිරීම හා පිළියෙල කිරීම, ආදායම් ඇස්තමේන්තු හා මුදල් ප්‍රවාහ තත්ත්වය අධීක්ෂණය කිරීම.

- 2013 වර්ෂය සඳහා නියමිත ආදායම් ඇස්තමේන්තු, ආදායම් රැස්කිරීමේ දෙපාර්තමේන්තු හා සම්බන්ධ වී සකස් කරන ලදී.

- භාණ්ඩාගාර ලේකම්වරයා, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරුන්, භාණ්ඩාගාර දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආදායම් රැස්කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් සහ අනෙකුත් අදාළ ආයතනවල සහභාගිත්වයෙන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති කමිටුවෙහි රැස්වීම් හතරක් (කාර්තුමය වශයෙන්) පවත්වන ලදී.

- ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය මාසික ආදායම් වාර්තා මගින් සහ විශේෂ තොරතුරු ලබා ගැනීම මගින් ද අධීක්ෂණය කළ අතර, ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා අවශ්‍යවන කාර්යසාධනය විශ්ලේෂණය කිරීමද සිදු කරන ලදී.

2.7 2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත යටතේ අදාළ වාර්තා ප්‍රකාශයට පත් කිරීම.

- **වාර්ෂික වාර්තාව 2011**

  2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 13 වන වගන්තිය යටතේ මුදල් වර්ෂය අවසාන වී මාස පහක් ඉක්මවා යාමට මත්තෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර මහජනතාවට නිකුත් කළ යුතු අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව එනම් 2011 වාර්ෂික වාර්තාව, 2012 මැයි මස දී ප්‍රකාශයට පත් කෙරිණි.

- **වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2012**

  2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 10 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කළ යුතු මෙම වාර්තාව අදාළ වර්ෂයේ ජූනි මස අවසාන දිනට හෝ විසර්ජන පනත සම්මත වීමෙන් මාස හයක් ඉක්ම යාමට පෙර යන කාල පරිච්ඡේද දෙකෙන් පසුව එළඹෙන දිනට ප්‍රථම, සෑම වසරකම නිකුත් කළ යුතු අතර, 2012 වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව 2012 ජූනි මස ප්‍රකාශයට පත් කරන ලදී.

- **රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව - 2013**

  2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 4, 5 සහ 6 වන වගන්ති යටතේ ඉදිරිපත් කෙරෙන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය වාර්තාව 2013 සහ 7, 8 සහ 9 වන වගන්ති යටතේ ඉදිරිපත් කළ යුතු අයවැය, ආර්ථිකය සහ රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව 2013 යන වාර්තා දෙකෙන් සමන්විත රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව 2012 නොවැම්බර් මස ප්‍රකාශයට පත් කරන ලදී.

2.8 තෙවැනි පාර්ශවයන් වෙත බදු නිදහස් කිරීම්, කල් දැමීම් ආදිය ලබා දීම සඳහා නිකුත් කරනු ලබන ලිපි රේගු දෙපාර්තමේන්තුව වෙත ලබා දීම පහසු කිරීම සඳහා අන්තර් ජාලය හරහා ක්‍රියාත්මක "Regulatory Approval Uploading System" ලෙස හැඳින්වෙන පරිගණක වැඩ සටහනක් රේගු දෙපාර්තමේන්තුව සහ මෙම දෙපාර්තමේන්තුව අතර ක්‍රියාත්මක කර ඇත.

3. පාලන හා ගිණුම්

3.1. සංවිධාන ව්‍යුහය

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 65 කින් සමන්විත වේ. ඒ අනුව පහත සඳහන් කාර්ය මණ්ඩලය මෙම දෙපාර්තමේන්තුව යටතේ සේවය කරයි.

කාර්ය මණ්ඩල විස්තර - 2012 (2012.12.31 දිනට)

තනතුර	අනුමත තනතුරු සංඛ්‍යාව	දැනට පුරවා ඇති සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
අධ්‍යක්ෂ ජනරාල්	01	01*	-
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	01	-	01
අධ්‍යක්ෂ ශ්‍රී. ලං. ප. සේ.	02	02	-
ශ්‍රී. ලං. ක්‍ර. සේ.	01	-	01
ජ්‍යෙෂ්ඨ ආර්ථික විද්‍යාඥ	01	-	01
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ ශ්‍රී. ලං. ප. සේ.	09	06**	03
නියෝජ්‍ය අධ්‍යක්ෂ ශ්‍රී. ලං. ක්‍ර. සේ.	02	01***	01
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ - ශ්‍රී. ලං. ක්‍ර. සේ.	01	01	-
සහකාර අධ්‍යක්ෂ ශ්‍රී. ලං. ක්‍ර. සේ.	02	-	02
ආර්ථික විද්‍යාඥ	01	-	01
සංඛ්‍යාලේඛනඥ	01	-	01
පරිපාලන නිලධාරි	01	01	-
භාෂා පරිවර්තක	02	01	01
පර්යේෂණ සහකාර	06	04	02
සංවර්ධන සහකාර	06	02	04
රාජ්‍ය කළමනාකරණ සහකාර	13	10	03
රියැදුරු	06	03	03
කා.කා.ස	09	07	02
එකතුව	**65**	**39**	**26**

* ශ්‍රී ලංකා මහ බැංකුවේ මාණ්ඩලික නිලධාරියකු අධ්‍යක්ෂ ජනරාල් ලෙස සේවය කරනු ලබයි.

** දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ජ්‍යේෂ්ඨ තක්සේරු නිලධාරියෙකු නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරක ක්‍රියා කරනු ලැබේ.

*** එතෙර අධ්‍යාපන නිවාඩු ලබා ඇත.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් අනුයුක්තව සිටින බදු උපදේශකවරියක ගේ සේවය ද මෙම දෙපාර්තමේන්තුවට ලැබේ.

3.2 මානව සම්පත් සංවර්ධනය

දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ වෘත්තීය කුසලතා සහ දැනුම වැඩි දියුණු කර ගැනීමට අවස්ථාව සැලසීම සඳහා විදේශ ශිෂ්‍යත්ව සහ දේශීය පුහුණු පාඨමාලාවන් සඳහා සහභාගී කර වූ අතර ඒ තුළින් ඔවුන්ගේ ඵලදායීතාව වැඩි දියුණු වීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යයක්ෂමව කරගෙන යාම අපේක්ෂා කෙරේ. කාර්ය මණ්ඩලය සඳහා 2011 දී ලබා දෙන ලද දේශීය හා විදේශීය පුහුණුවීම් පිළිබඳ විස්තර පහත සඳහන් වේ.

3.2.1 කාර්ය මණ්ඩල පුහුණු කිරීම

(අ) දේශීය පුහුණුවීම්

නම	තනතුර	පුහුණු ආයතනය සහ වැඩසටහන	පුහුණු කාලය
ඩී.ජී.පී.ඩබ්. ගුණතිලක මෙය.	බදු උපදේශිකා	PRAG ආයතනය - Introduction to International Financial Reporting Standards	2012 ජූනි 26
කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙය.	සහකාර අධ්‍යක්ෂ	මිලෝදා ආයතනය - Public Utility Pricing Policies, Issues, Options and Best Practices	2012 අප්‍රේල් 26
		ශ්‍රී ලංකා මහ බැංකුව - International Research Conference	2012 නොවැම්බර් 30
ඩබ්.එල්.පී. ප්‍රනාන්දු මිය	සහකාර අධ්‍යක්ෂ	මිලෝදා ආයතනය - Economic & Financial Appraisal of Projects	2012 පෙබරවාරි 03, 10, 17, 24 සහ මාර්තු 02,09,16,23
		මිලෝදා ආයතනය - Deficit Financing Mechanisms, Debt and Debt Management Strategies	2012 ජූනි 26 සිට 27 දක්වා
ඩබ්.එච්.ඒ. විමලජීව මිය	සහකාර අධ්‍යක්ෂ	ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය - 33rd National Conference of Institute of Chartered Accountants of Sri Lanka	2012 ඔක්තෝබර් 18 සිට 22 දක්වා
ඒ.ඩබ්.එම්.ඒ.අනුරාධ තිලකරත්න මහතා	සහකාර අධ්‍යක්ෂ	ශ්‍රී ලංකා මහ බැංකුව - Advanced Course on MS Excel	2012 පෙබරවාරි 02 සිට මාර්තු 29 දක්වා
		ජාතික ලේඛණාරක්‍ෂක දෙපාර්තමේන්තුව - රාජ්‍ය ලේඛණ පරිපාලනය හා ලේඛණාරක්‍ෂක නීතිය පිළිබඳ එක් දින පාඨමාලාව	2012 ජූනි 08

		PRAG ආයතනය - Introduction of International Financial Reporting Standards	2012 ජූනි 26
		ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ නියෝජිතායතනය - Future Gov SAARC Summit 2012	2012 ජූලි මස 18 දින සිට 19 දක්වා
එම්.ඒ.එන්. සී. පෙරේරා මිය	සහකාර අධ්‍යක්‍ෂ	ශ්‍රී ලංකා මහ බැංකුව - Applied Econometrics – A Practical Approach Using Econometric (E – Views) Software	2013 ජනවාරි 18 සිට ජූනි 13 දක්වා
		ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව - Residential Training Programme on Main Streaming (DDR) in Sri Lanka	2012 මැයි මස 11 දින සිට 12 දින දක්වා
		මිලෝදා ආයතනය - Deficit Financing Mechanisms, Debt and Debt Management Strategies	2012 ජූනි 26 සිට 27 දක්වා
		ශ්‍රී ලංකා මහ බැංකුව - International Research Conference	2012 නොවැම්බර් 30
එස්.ඒ.පී.කේ. දිසානායක මහතා	පර්යේෂණ සහකාර	කැළණිය විශ්ව විද්‍යාලය - ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (ආර්ථික විද්‍යාව) - 2011	2012 සිට මේ දක්වා
බී.එස්. ජයසුන්දර මිය	සංවර්ධන සහකාර	මිලෝදා ආයතනය - Effective Documentation Using MS Word	2012 නොවැම්බර් 20 සිට 22 දක්වා
ඩබ්.එම්.එම්.පී. පෙරේරා මිය	රාජ්‍ය කළමනාකරණ සහකාර	මිලෝදා ආයතනය - Government Payroll Management System	2012 අගෝස්තු 06 සිට 11 දක්වා
ටී.පී. ආරියතිලක මිය	රාජ්‍ය කළමනාකරණ සහකාර	නිපුණතා සංවර්ධන අරමුදල - Public Procurement Procedures	2012 නොවැම්බර් 29 සහ 30
එස්.ඩබ්.එස්. එන්. දිලන්තිකා මිය	රාජ්‍ය කළමනාකරණ සහකාර	නිපුණතා සංවර්ධන අරමුදල - Public Procurement Procedures	2012 නොවැම්බර් 29 සහ 30
එම්.එම්.ගුණවර්ධන මයා	රාජ්‍ය කළමනාකරණ සහකාර	ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය - Transport Management	2012 නොවැම්බර් 30
සී.වයි. රණසිංහ මිය	රාජ්‍ය කළමනාකරණ සහකාර	මිලෝදා ආයතනය - Effective Documentation Using MS Word	2012 නොවැම්බර් 20 සිට 22 දක්වා

ටී.ඩී.ඒ. සිරිවර්ධන මයා	කා. කා. ස.	ජාතික ශ්‍රම අධ්‍යන ආයතනය - ඉහළ ශ්‍රම ඵලදායීතාව	2012 ඔක්තෝබර් 11 සහ 12

3.2.2. විදේශීය පුහුණුවීම් /වැඩමුළු

නම	තනතුර	පුහුණු ආයතනය සහ වැඩසටහන	පුහුණු කාලය
කේ. එම්. මහින්ද සිරිවර්ධන මහතා	අධ්‍යක්‍ෂ ජනරාල්	7th Policy Consultation Forum of the Seoul Initiative Network on Green Growth: The Double Dividend of "Green" and "Economy" held in Jeju Special Self- Governing Province – Republic of Korea	2012 මැයි 30 සිට ජූනි 01 දක්වා
		Commonwealth Finance Ministers Meeting and IMF World Bank Annual Meetings – Japan	2012 ඔක්තෝබර් 08 සිට 15 දක්වා
කේ. ඒ. රම්‍යා කාන්ති මෙය.	අධ්‍යක්‍ෂ	Seminar on Macroeconomic Development for Developing Countries – China	2012 සැප්තැම්බර් 06 සිට 26 දක්වා
		Official Delegation to India	2012 දෙසැම්බර් 12 සිට 15 දක්වා
එම්.ඒ.එන්.සී. පෙරේරා මිය	සහකාර අධ්‍යක්‍ෂ	Course on Macroeconomic Management and Fiscal Policy (MFP) – India	2012 සැප්තැම්බර් 10 සිට 21 දක්වා
කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙය.	සහකාර අධ්‍යක්‍ෂ	IMF – Singapore Training Institute - Macroeconomic Forecasting	2012 මාර්තු 18 සිට 31 දක්වා
		Design Sequencing and Implementation of Public Financial Management Reforms	2012 ජූලි 09 සිට 13 දක්වා
ඒ.ඩබ්.එම්.ඒ.අනුරාධ තිලකරත්න මහතා	සහකාර අධ්‍යක්‍ෂ	Seminar on Macro Fiscal Forecasting and Analysis – Singapore	2012 ජූලි 23 සිට 27 දක්වා
එම්.කේ.සී. සේනානායක මහතා	සහකාර අධ්‍යක්‍ෂ	Ph.D. Programme in Economics at the University of New South Wales -Australia	2011 ජනවාරි සිට 2014 දෙසැම්බර් 04 දක්වා

3.3. මූල්‍ය පරිපාලනය

2012 වර්ෂය සඳහා 238 ශීර්ෂය යටතේ මෙම දෙපාර්තමේන්තුවට අයවැය ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර එම ප්‍රතිපාදන යොදා ගත් ආකාරය පහත දැක් වේ.

(i) 2012 අයවැය ප්‍රතිපාදන යොදා ගත් ආකාරය

වියදම් විස්තරය	2012 ඇස්තමේන්තුව රුපියල්	2012 ශුද්ධ ප්‍රතිපාදන රුපියල්	2012 සත්‍ය වියදම රුපියල්
පුනරාවර්තන වියදම්	**637,700,000**	**636,800,000**	**127,561,376**
පුද්ගල පඩිනඩි	24,500,000	25,500,000	220,086,172
ගමන් වියදම්	650,000	2,000,000	1,691,125
සැපයීම්	2,250,000	2,265,000	2,072,889
නඩත්තු වියදම්	2,750,000	2,890,000	1,236,129
ගිවිසුම්ගත සේවා	607,350,000	603,795,000	100,160,272
මාරු කිරීම් හා වෙනත්	200,000	350,000	314,789
මූලධන වියදම්	**700,000**	**1,600,000**	**1,142,706**
පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම්	100,000	100,000	68,622
අත්පත්කර ගැනීම්	400,000	800,000	717,834
ප්‍රාග්ධන මාරුකිරීම්	-	-	-
හැකියා වර්ධනය	200,000	700,000	356,250
මුළු එකතුව	**638,400,000**	**638,400,000**	**128,704,082**

(ii) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම

2012 වර්ෂය සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ විස්තර පහත දැක්වේ.

විස්තරය	අනුමත සීමාව රුපියල්	සත්‍ය සීමාව රුපියල්
1. උපරිම වියදම් සීමාව	2,600,000.00	2,069,915.63
2. අවම ලැබීම් සීමාව	1,000,000.00	1,653,258.58
3. උපරිම හර ශේෂ සීමාව	10,000,000.00	7,151,435.89

(iii) විගණන විමසුම්

2012 වර්ෂය තුළ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ විගණන විමසුම් 05 ට සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් ලද විගණන විමසුම් 05 සඳහා පිළිතුරු ලබා දී ඇත.